# එ ජා පක්‍ෂයේ සිංහල විරෝධය

එක්සත් ජාතික පක්‍ෂය යනු විජාතික බලවේගවල නියෝජිත පක්‍ෂය වෙයි. එක්තරා කාලයක, විශේෂයෙන් ම ලංකා සමසමාජ පක්‍ෂය හා කොමියුනිස්ට් පක්‍ෂය මාක්ස්වාදී මතිමතාන්තරවල හිරවී ජාතිකත්වයට එරෙහිව ක්‍රියාකරමින් සිටි මුල් අවධියෙහි දී (දැනට ද ඒ පක්‍ෂ එසේ ම ය) මෙරට ජාතිකත්වය ඇගයූ ඇතැම් පිරිස් එක්සත් ජාතික පක්‍ෂය වටා රොක්වූහ. එහෙත් 1954 න් පමණ පසුව මේ පිරිසෙන් බහුතරය ශ්‍රී ල නි පක්‍ෂයට ඇදී ගිය බව පෙනෙන්නට ඇත. ඉන් පසු එක්සත් ජාතික පක්‍ෂයේ විජාතිකත්වය තව තවත් තහවුරුවන්නට විය. විශේෂයෙන් ම ජේ ආර් ජයවර්ධන මහතාගේ නායකත්වය යටතේ ඒ ප්‍රවණතාව තව තවත් තීව්‍රවිය. අද වන විට රනිල් වික්‍රමසිංහ මහතාගේ නායකත්වය යටතේ එ ජා පක්‍ෂය බටහිර කොන්සර්වෙටිව් පක්‍ෂයක් මෙන් ක්‍රියාකරයි.

පසුගිය දා ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ලෙස එ ජා පක්‍ෂය උතුරු හා නැගෙනහිර පළාත් අවුරුදු අටකට හෝ දහයකට හෝ තාවකාලික ව එක්කිරීමට යෝජනා කෙළේ ය. මේ යෝජනාවෙන් ම පැහැදිළිවන්නේ ඒ පක්‍ෂය සාමාන්‍ය සිංහල මිනිසුන්ගෙන් කෙතරම් ඉවත් වී ඇත් ද යන්න ය. උතුරු හා නැගෙනහිර පළාත්සභා ජේ ආර් ජයවර්ධන මහතා විසින් ද ගැසට් නිවේදනයක් මගින් එක්කරනු ලැබුයේ ද තාවකාලික ව ය. ඒ එකතුකිරීම සම්බන්ධයෙන් ඉක්මණින් ජනමත විචාරණයක් පැවැත්වීමට ද ඒ දිනවල කතාබස් කෙරෙනි. අවාසනාවකට තාවකාලික එක්කිරීම සදාකාලික එකක් ලෙස සැලකිණි. එසේ ම පවත්වන ලද ජනමත විචාරණයක් ද නො වී ය. අද එ ජා පක්‍ෂය අවුරුදු අටකට හෝ දහයකට හෝ උතුරු හා නැගෙනහිර පළාත් එක්කිරීමට කතාකරන විට අපට මෑත අතීතය ද මතක් වෙයි. අවුරදු අට හෝ දහය හෝ අවුරුදු අසූවක් අනුවක් වනු වැළැක්විම තරමක් අසීරු ය.

දැන් එක්සත් ජාතික පක්‍ෂය තවත් සිංහල විරෝධී මත ප්‍රකාශකරමින් සිටියි. එ ජා පක්‍ෂයට අනුව මෙරට බහුතර ජනවර්ග තුනක් වෙයි. ඒ සිංහල, දෙමළ හා මුස්ලිම් යනුවෙනි. සිංහල දෙමළ මුස්ලිම් ජනකොටස් නැතිව ගතහොත් ලංකාවේ ඉතිරිවන්නේ වෙට්ටි වැනි පිරිස් ය. අභිභූණ්ඩික ජනයා ද අයත්වන්නේ ඉතිරි කොටස ට ය. මෙරට බහුතර ජනවර්ග සිංහල, දෙමළ හා මුස්ලිම් යැයි කී විට එමගින් ප්‍රශ්නය විසඳීමට මගක් පැදෙන්නේ යැයි එ ජා පක්‍ෂය සිතනවා විය හැකි ය. එහෙත් ප්‍රශ්න එසේ නො විසඳෙයි. හිතා මතා හෝ නැතිව හෝ බොරු කතා  ප්‍රචාරය කිරීමෙන් සේවයක් අත්වන්නේ දෙමළ, ඉස්ලාම් ජනයාට මිස ඒ පළාත්වල හෝ වෙනත් තැන්වල සිටින සිංහල ජනතාවට නො වෙයි.

සිංහල, දෙමළ, මුස්ලිම් බහුතර ජනවර්ග යැයි කී විගස ඒ කොටස් තුනම එකම තත්වයකට පත්වෙයි. දෙමළ ජනයාට සැමදාමත් මුස්ලිම් ජනයාට මෑතක සිටත් අවශ්‍ය වන්නේ සිංහලයන්ට මෙරට හිමිවිය යුතු තැන අහිමිකිරීම ය. සිංහලයන් මෙරට බහුතරය බව, සිංහලයන් මෙරට අනන්‍ය සංස්කෘතියක් ගොඩනගා ඇති බව, මෙරට සිංහල සංස්කෘතිය වැදගත් සංස්කෘතිය බව ආදිය අමතකකර කටයුතුකිරීමට දෙමළ නායකයන්ට අවශ්‍ය වෙයි. සිංහල විරෝධී එ ජා පක්‍ෂය අද විවෘතව ම මෙරට සිංහලයන්ට හිමි විශේෂ තැනක් නැති බව කියන්නේ විජාතික බලවේගවල අවශ්‍යතාව නියෝජනයකරමිනි.

අප රටේ ප්‍රශ්නය කිහිප ආකාරයකින් සූත්‍රගත කළහැකි ය. මෙරට සිංහලත්වයට හිමිතැන අහිමිකිරීම එක් සූත්‍රගතකිරීමකි. එහෙත් ඒ එකම සූත්‍රගතකිරීම නො වෙයි. අද ඇතැමුන්ට අනුව මෙරට කළයුතු කාර්යය වනුයේ ජාතිය ගොඩනැංවීම ය. බටහිරයන්ගේ ඊනියා ජාතික රාජ්‍ය සංකල්පය පසුපස යමින් ඔවුහු ඔවුන් කියන අන්දමට පශ්චාත් නිදහස් ලංකාවක ජාතිය ගොඩනැගීමට කතාකරති. එහෙත් අප කාලයක් තිස්සේ කියා ඇත්තේ මෙරට ජාතිය ගොඩනැගීමේ අවශ්‍යතාවක් නැති බව ය. එයට හේතුව සිංහලයන් පණ්ඩුකාභය රජු දවස ජාතිය ගොඩනගා තිබීම ය. බටහිරයන් ජාතීන් ගොඩනැගුවේ දහසයවැනි සියවසෙන් පසුව ය. එසේ වූ කල සිංහලයන් දැනට අවුරුදු දෙදහස් හාරසීයකට පෙර ජාතියක් ගොඩනගන්නේ කෙසේ දැයි අසන්නෝ ද සිටිති.

ඔවුන්ගේ සංකල්ප ලෝකයෙහි ජාතිය යන්න දහසයවැනි සියවසට පෙර නැති වුවත් සිංහලයන්ගේ ලෝකයෙහි ඒ සංකල්පය තිබූ බවට හොඳම සාක්‍ෂිය මහාවංසය වෙයි. අප සිංහබාහු ප්‍රවාදය යනුවෙන් හඳුන්වන කතාව නිර්මාණය වී ඇත්තේ ම ජාතියේ ආරම්භය මෙසේ සිදුවිණි යැයි පැවසීමට ය. දේවානම්පිය තිස්ස රජුගෙන් පසුව ඒ ජාතිය

© Prof. Nalin De Silva

සිංහල බෞද්ධ විය. ගැමුණු කුමරු ඒ ජාතියට (අලිඛිත) ව්‍යවස්ථාවක් හා හෘදය සාක්ෂියක් සැපයී ය. ඉන්පසු මෙරටට සංක්‍රමණීය වූ ජනකොටසක් වී නම් ඔවුහු පරම්පරාවක් දෙකක් ඇවෑමෙන් සිංහල බෞද්ධ වූහ. නිශ්ශංකමල්ල රජුගේ කාලිංග සම්භවය හෝ පණ්ඩුකාභය රජුගේ පාණ්ඩ්‍ය සම්භවය හෝ සපුමල් කුමරුගේ කේරළ සම්භවය හෝ ගැන තකතීරු කතා කියන පඬියන්ට කිවයුත්තේ ඔවුන් සිංහල බෞද්ධ සංස්කෘතියට ඇතුල් වී සිංහල බෞද්ධයන් වූ බව ය.

පිටරටින් පැමිණෙන්නන් එසේ සිංහල බවට පත්වීම නැවතී ඇත්තේ ලන්දේසීන් තම දුම්කොළ වගාවට දකුණු ඉන්දියාවෙන් (අද තමිල් නාඩුව ලෙස හැඳින්වෙන ප්‍රදේශයෙන්) දෙමළ ජනයා ආනයනයකිරීම ඇරඹීමෙන් පසුව ය. අද යාපනයේ සිටින්නේ මෙසේ ආනයනය කළවුන්ගෙන්, එහි සිටි කේරළයෙන් ගෙන එනු ලැබූ වෙලක්කාරයන්, හා සිංහලයන්ගෙන් පැවළ එන්නවුන් ය. යාපනයේ දෙමළ ඉතිහාසය පටන්ගැනෙන්නේ දහහත්වැනි සියවසෙන් පසුව ය. මෙරටට මුවර් නමින් හැඳින්වෙන මුස්ලිමුන් පැමින ඇත්තේ ද දකුණු ඉන්දියාවෙනි. මෙරට මුවර් මුස්ලිමුන් දෙමළ කතාකරන්නේ එබැවිනි. ඔවුන් අරාබියෙන් පැමිණි පියවරුන්ගෙන් හා සිංහල මව්වරුන්ගෙන් පැවතෙන්නේ නම් ඔවුන් එක්කෝ අරාබි බස කතාකළ යුතු ය. නැත්නම් සිංහල බස කතාකළ යුතු ය. දහසය වැනි සියවසෙන් පසුව ලන්දේසීන් විසින් ආනයනය කරනු ලැබූවන්ගෙන් හා අනෙක් අයගෙන් පැවතෙන දෙමළ ජනයා, ඉන්පසුව බ්‍රිතානීන් ආනයනය කර නැගෙනහිර පළාතේ පදිංචිකල දෙමළ ජනයා, එයටත් පසුව බ්‍රිතානීන් කෝපි හා තේ වගාවට ආනයනය කර වතුකරයේ පදිංචිකළ දෙමළ ජනයා, මුස්ලිම් ජනයා, තෙළිගු දේශයෙන් පැමිණි අභිගුණ්ඨික ජනයා හා සිංහලයන් සමග අනාදිමත් කාලයක් තිස්සේ ජීවත්වන වැදි ජනයා සිංහල ජාතියට ඇතුළත් නොවූ ජනවර්ග වෙයි. මෙයට අමතරව ජාවා රටින් (ඉන්දුනීසියාවෙන්) ලන්දේසීන් විසින් ගෙන්වනු ලැබූ ඉස්ලාම් ආගම අදහන ජනයා වෙති. ඔවුහු සිංහලයන් සමග එකට ජීවත්වීමේ ප්‍රතිඵලයක් ලෙස සිංහල ඉස්ලාම් බවට පත්වෙමින් සිටිති. අද සිංහලයෝ ආගමින් බෞද්ධ, කතෝලික, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ලෙස වෙන් වුවත් සංස්කෘතියෙන් සිංහල බෞද්ධයෝ වෙති.

වැදි ජනයා කාලාන්තරයක් තිස්සේ සිංහල නොවූයේ සිංහලයන්ට ඔවුන් සිංහල කිරීම අවශ්‍ය නොවුණු බැවින් හා වැදි සංස්කෘතියේ අනන්‍යතාවට සිංහලයන් ගරුකළ බැවිනි. එහෙත් අද වැදි ජනයා ද බටහිර ආභාසයෙන් සිංහල බවට පත්වෙමින් සිටිති. අභිගුණ්ඨික ජනයාගේ ජීවන රටාව හේතුකොටගෙන ඔවුහු සිංහල නොවූහ. එහෙත් අද ඔවුනට ඒ ජීවන රටාව තවදුරටත් ගෙනයෑමට නොහැකි වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් ද වැඩිකල් නොගොස් සිංහල බවට පත්වනු ඇත. එවිට ඉතිරිවන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වල හා වතුකරයේ දෙමළ ජනයා හා මුවර් නමින් හැඳින්වෙන මුස්ලිම් ජනයා ය. සිංහලයන් ආගමින් වෙනස් වී සිටින්නාක් මෙන් ම කතාකරන බස වෙනස් වූ සිංහලයන් සිටීමේ බාධාවක් නැත. කුමාරතුංග මුනිදාස මහතා කලකට පෙර සිංහල දෙමළ, සිංහල මුස්ලිම් යනුවෙන් දෙමළ හා මුස්ලිම් ජනයා සිංහල ජාතියට එක්කිරීමක් ගැන කතාකර ඇත. එසේ නම්කිරීමේ දුෂ්කරතාවක් තිබිය හැකි වුවත් ඒ සංකල්පය වැදගත් වෙයි. අප ද කලක සිට සඳහන්කර ඇත්තේ දෙමළ හා මුවර් මුස්ලිම් ජනයා සිංහල ජාතියට ඇතුල්කිරීම පිළිබඳව ය.

අපට ජාතියක් අමුතුවෙන් ගොඩනැගීමේ අවශ්‍යතාවක් නැත්තේ යක්ෂ, නාග, දේව ආදී ගෝත්‍රිකයන්ගේ එකතුවෙන් අවුරුදු දෙදහස් හාරසීයකට පෙර සිංහල ජාතිය ගොඩනගා ඇති බැවිනි. බටහිරයන් හා ඇංකර උගතුන් ජාතියක් ගොඩනැගීම ගැන කතාකිරීම සිංහලයන්ට රුචි වුවක් නො වේ. එසේ කතාකිරීම ම සිංහලත්වයට හිමිතැන අහිමිකිරීමක් ලෙස ඔවුහු සලකති. කළයුතුව ඇත්තේ දෙමළ හා මුවර් මුස්ලිම් ජනවර්ග වෙනම නොතබා ඔවුන් ද ගොඩනැගී ඇති ජාතියට ඇතුල්කරගැනීමේ ක්‍රමයක් ගැන කල්පනාකිරීම ය. මේ පිළිබඳ ව කලකට පෙර අප ලියා තිබුණ ද (ජාතිය, සංස්කෘතිය හා චින්තනය පොතෙහි ද ඒ පිළිබඳ විස්තරයක් වෙයි.) නොයෙකුත් හේතු නිසා ඒ වර්ධනයකිරීමට නොහැකි විය. එහෙත් එ ජා පක්ෂය විජාතික අවශ්‍යතා හේතුවෙන් සිංහලයන්ට විරුද්ධව බහුතර ජනවර්ග තුනක් ගැන කතාකිරීමට පටන්ගෙන ඇති බැවින් ඒ සාකච්ඡාව ඉදිරියට ගෙනයමින් එ ජා පක්ෂයේ විජාතික බලපෑම් පරාජය කළයුතුව ඇත. මේ බහුතර කතාවම අපට දුන්නෝ බ්‍රිතානියෝ ය. ඔවුහු මුල දී සිංහල දෙමළ ජනයා බහුතර ජනයා ලෙසසැලකූහ. පසුව සිංහලයන් පමණක් බහුතරය ලෙස සැලකූහ. අද ඔවුහු එ ජා ප ඔස්සේ බහුතර ජනවර්ග තුනක් ගැන කතාකරති. එ ජා පක්ෂයේ හඬ එහි ස්වාමියාගේ හඬ ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva